# මගේ සුරතල් කිරා



එච්.පී.ජේනුකි සෙසන්ලි පතිරණ

# මගේ සුරතල් කිරා

කතෘ - එච්.පී.ජේනුකි සෙසන්ලි පතිරණ

කතෘගේ වෙනත් කෘති

1. අසනීප උන කිරි අම්මා
2. සිහින බිංදුව

පාසල - මහාමායා බාලිකා විදුහල
ඉගෙනුම ලබන පන්තිය - 4 ශ්‍රේණිය
කෘතිය පළ කරන දිනය - 2026.05.10

# පිදුම

**මාගේ ආදරණීය සමන්මලී**

**ගුරුමෑනියන්ටත් මාගේ 3 ශ්‍රේණිය පන්තිභාර**

**චමිලා ගුරු මෑණියන්ටත් සෙනෙහසින්**

**පිලිගන්වමි.**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය



CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඔන්න එක දවසක මම මිදුලේ ටැප් එකෙන් අත
සෝදමින් හිටියා පරිසරය හරිම ලස්සනයි.
නිස්කලංකයි. නිවාඩු දවසක් නිසා මම ගොඩක් වෙලා
මිදුලේ සිටියා .



එක පාරටම වතුරට යමක් වැටුණ සද්දයක් ඇසුණා. ඒ එක්ම චීස් චීස් යන හඬ ඇසුණා. මම නොඉවසිල්ලෙන් වට පිට බැලුවා. අනේ!වතුර බාල්දිය ඇතුලේ චූටි ලේන පැටියෙක්.



මම කෑගහලා අත්තම්මට කතා කළා.

අත්තම්මා මගේ හඩට එතෙන්ට දුවගෙන ආවා.

අත්තම්මා ලේන් පැටියාව අතට අරගෙන


ලේනුසුවකින් පිස දැමුවා.

රෙදි කෑල්ලක් අරගෙන හෙමින් එතුවා.

මම ඒ දෙස බලන් හිටියේ හරිම පුදුමයෙන්.

හිතට බයකුත් දැනුනා, ලේන් පැටියාට


කරදරයක් වෙයි කියලා.



අත්තම්මා ඉක්මනින් පැටියට ඉන්න තැනක් හෙව්වා. මම පැටියව අතේ තියන් පරිස්සමට බලා ගත්තා. මොකද කියනවනම් ‘‘පූස් රාල මාන බලාගෙන සිටියේ පැටියාව අල්ල ගන්න’’ කියලා අත්තම්මා කිව්වා.



අත්තම්මා හොයාගත්ත කූඩේ ඇතුලේ චූටි ලේන පැටියාව හෙමින් තියලා අපි හැමෝම සතුටින් ඒ දෙස බලාගෙන සිටියා.
අම්මත් වැඩ ඇරිලා ගෙදර ඇවිත් ලේන් පැටියාව දැකලා කිරි ටිකක් හදලා පාන් තිරයක් අරගෙන කිරි පෙව්වා.
ලේන් පැටියා කිරි බොනවා මම බලන් හිටියේ ඇරිම ආසාවෙන්.



එදා රෑ මට නිදාගන්න නම් හිත දුන්නේම නෑ.

ඒත් අම්මාගේ කීමට ඇඳට ගියේ ලේන් පැටියාත්


අරගෙනමයි.

එයා දිහා බලාගෙනම මට නින්ද ගියා.ටික

වෙලාවකින් මම ලස්සන හීනයක් දැක්කා.

ඒ හීනේ හිටියේත් මගේ ලේන පැටියා.

එයාට මම හීනෙන් නම තිබ්බා "කිරා" කියලා.



උදෙන්ම නැගිට්ලා කිරත් එක්ක ටික වේලාවක්

හිටියා.  මෙහෙම දවස් ගණන් නොදැනීම ගෙවිලා ගියා.

මම යාළුවන්ටක් කිරා ගැන කිව්වා.

දැන් එයා ටිකක් ලොකුයි පලතුරුත් කනවා.

ඒත් පැටියාගේ අම්මනම් අපිට තවම සොයාගන්න


බැරිවුනා.



දවසක් අපේ ගෙදර අමුතු දුගඳක් දැනුණා. අම්මා හැම තැනම ඒ ගැන සොයා බැලුවා. අන්තිමට ඒ දුගඳ හමන්නේ වහල තිබුන පරණ කාමරෙන් කියලා දැන ගත්තට පසු අපට මදුරු දැලේ පැටලිලා මිය ගිහින් සිටි ලොකු ලේනෙක් දැකගන්න පුලුවන් වුණා. ඒ කිරාගේ අම්මා කියලා අපිට හිතුනා.



මේ පැටියව කොහොම හරි ආදරෙන් ලොකු වෙනකල්
බලාගන්න ඕනේ කියලා අත්තම්මා කිව්වා.
මෙහෙම සති දෙක තුනක් ගතවුණා.
කිරා අපි දෙන කෑම කාලා දැන් ලොකුයි.
කිරා කියන නම එයාට දැන් හොඳටම හුරුයි.



එයාව නිදහස් කරන්න ඕනේ කියලා අප්පච්චි කියනකොට එදානම් මට ගොඩක් දුක හිතුණා.
ඒත් එයාටත් නිදහස ඕනේ නිසා පෙට්ටිය එළියෙන් තියලා එයා යන දිහා මම ගොඩක් දුකින් බලන් හිටියා.
කිරත් මගේ දිහා බලන් ගහෙන් ගහට පැන පැන ඈතට ගියා.



ඒත් එයාව අමතක කරන්නට මට බැරිව ගියා. කෑම ලෑල්ලට බත් දාලා කිරා කියලා කතා කරාම කිරා කොහේ ඉදන් හරි එනවා. ඒක මගේ හිතට සතුටක්. කිරා හැමදාමත් අපේ ලගින්ම ඉන්නවා. අසරණ වුණ කාටත් උදව් කලාම අන්තිමට ඉතිරි වන්නේ ලොකු සතුටක් ඒක අපි හැමෝටම ලොකු පාඩමක්.





# පසුවදන

## ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් ගුරුතුමාගේ ප්‍රකාශය

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN **978-624-508-979-9**

# ස්තූතියි

මෙම ග්‍රන්ථය සෑදීමට උපකාර කල ආදරණීය
පන්තිභාර මංජුලා ගුරු මෑනියන්ටත්
මායා විදු මෑනියන්ටත්
මාගේ ගෞරව සිතූතිය පුද
කරමි.